# සංක්ෂිප්තය

මෙම පර්යේෂණයේ පරමාර්ථය වන්නේ 10 ශ්‍රේණියේ සිසුන්ගේ පාසල් පුස්තකාලය භාවිතය පිළිබඳව පරීක්ෂා කිරීමයි .විවිධ වු මුද්‍රිත මාධ්‍ය හා මුද්‍රිත නොවන මාධ්‍ය ඔස්සේ තොරතුරු වෙත ලඟා වීමේ හැකියාව පුළුල් වී ඇති වර්තමාන යුගයේ පාසල් පුස්තකාලයේ පවතින සම්පත් පිළිබඳව 10 ශ්‍රේණියේ සිසු සංජානනය විමසා බැලීම , පාසල් පුස්තකාල සම්පත් වල ස්වභාවය විමසා බැලීම, 10 ශ්‍රේණියේ සිසුන් පාසල් පුස්තකාලය භාවිතයට පෙළඹෙන හේතු සොයා බැලීම, සිසුන්ගේ පාසල් පුස්තකාල භාවිතය වර්ධනය කිරීමට පුස්තකාලයාධිපතිවරුන් ගෙන ඇති ක්‍රියාමාර්ග සොයා බැලීම හා පාසල් පුස්තකාල භාවිතයට සිසුන් පෙළඹවීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීම යන අරමුණු ඉටු කර ගැනීම සඳහා මෙම පර්යේෂණය සිදු කරන ලදී.

නියදිය ලෙස මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපයේ මීරිගම අධ්‍යාපන කොට්ඨාසයේ 1C පාසල් දෙකකින් සිසුන් 65 දෙනෙකුත් 2 වර්ගයේ පාසල් හතරකින් 35 දෙනෙකුත් නියෝජනය වන ලෙස සිසුන් 100 දෙනකු තෝරා ගන්නා ලදී . එම පාසල් වල පුස්තකාලයාධිපතිවරු 06 දෙනාද විදුහල්පතිවරු 06 දෙනාද පර්යේෂණයට සහභාගී කර ගන්නා ලදී .

ප්‍රශ්නාවලී ,සම්මුඛ සාකච්ඡා, නිරීක්ෂණ පත්‍රිකා යනාදී ක්‍රම ශිල්ප මගින් දත්ත එක්රැස් කරන ලදී. දත්ත විශ්ලේෂණය කිරීම සඳහා ගුණාත්මක හා ප්‍රමාණාත්මක ප්‍රවේශයන් භාවිත කරන ලද අතර ප්‍රමාණාත්මක දත්ත ප්‍රතිශත, ප්‍රස්තාර හා වගු ආශ්‍රයෙන් සංක්ෂිප්තව විග්‍රහයකට ලක්කරන ලදී. පුස්තකාලයාධිපතිවරුන්ගේ හා විදුහල්පතිවරුන්ගේ ආකල්ප ඔස්සේ ලබා ගත් දත්ත ගුණාත්මකව විශ්ලේෂණය සිදු කරන ලදී.

පර්යේෂණයේ නිගමනයන්ට අනුව 10 ශ්‍රේණියේ සිසුන් පාසල් පුස්තකාලය භාවිතය පිළිබඳ දැඩි උනන්දුවක් නොදක්වන අතර පුස්තකාලයේ පවතින පොත්පත් මෙන්ම විද්‍යුත් මෙවලම් අධ්‍යාපන කටයුතු සඳහා ප්‍රමාණවත් නොවන බවත්, පාසල් පුස්තකාලයාධිපතිවරු සිසුන්ගේ දැනුවත් භාවය වර්ධනය කිරීමට ගන්නා ක්‍රියාමාර්ග අවම බැවින් සිසුන් පුස්තකාලය භාවිතයද අවම මට්ටමක පවතී. එමෙන්ම පාසල් පුස්තකාලයාධිපතිවරු ලෙස සේවය කරන්නේ උපගුරුවරුන් බැවින් පුස්තකාලවල කාර්යභාර්ය නිසිලෙස ඉටු කිරීමට ප්‍රායෝගිකව ගැටලු මතුවී ඇති බවද පුස්තකාලයාධිපතිවරුමෙන්ම විදුහල්පතිවරුද පෙන්වා දී ඇත.

මෙම තත්ත්වයන් මගහරවා ගැනීමට යෝජනාවන් ලෙස පෙන්වා දිය හැකි වන්නේ ,පුස්තකාලයේ සේවය සඳහා නිසි පුහුණුවක් ලැබූ උපගුරුවරුන් හෝ පුස්තකාලයාධිපතිවරුන් පත්කළ යුතුය. පාසල් පුස්තකාලය පවත්වා ගැනීමට සුදුසු ස්ථානයක් තිබිය යුතුය. එමෙන්ම 10 ශ්‍රේණියේ සිසුනහට පුස්තකාලයේ තොරතුරු වෙත ළඟාවීමේ පහසුව ඇති කිරීම තුළින් සිසුන්ට සමීප ස්ථානයක් බවට පාසල් පුස්තකාලය සංවර්ධනය කළ යුතුය.

# Abstract

The purpose of this research is to scrutinize the usage of school library by the Grade 10 students out of this following points are taken into account in view of the present condition where a broaden focuses is prevailing as the possibility of getting access to the information in regard with both printing and non-printing media looking for a perception of grade 10 students about the usage of library .Examine the nature of the resources available in the school libraries. The steps which are taken by the librarians to improve the usage of school libraries and suggestions of them .This research has been done to fulfill for the above purpose.

Just for the sample of the research students were chosen from the Meerigama educational Division in Minuvangoda educational zone, to the ratio of 65 students from type 1c two schools ,35 students from type 2 schools therefore altogether 100 students were chosen .6 librarians and 6 principals have been used to this research.

Necessary data were accumulated strategically through Quesionaires,Interviews and observational sheets .As for analyzing data qualitative and quantitative methods have been used. And also quantitative data have been presented through percentage diagram and charts. Qualitative data has been explained depend on the attitudes of the principals and librarians.

The conclusion of the research is the usages of the library in grade 10 students are not keen on the books and the electric equipment which are available in the library. The reason of the above situation is not sufficient conscious the students about the usage of library. All most all the librarians are the school teachers. So there can be seen a lots of problems have been orison related to the usage of library this situation has been indicated by the principals of schools.

These are the suggestions to avoid these situations the qualified teachers or trained librarians should be appointed to work in the library. There should be a suitable place for the library. And also the grade 10 students are able to reach information of the library. The library should be the closed place for the students.